# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2342/09 - 2023 ජූලි මස 24 වැනි සඳුදා - 2023.07.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32, 33 සහ 41 වගන්ති ප්‍රකාර නියමයන්

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය රොෂාන් රණසිංහ වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනත හා එහි සංශෝධන අනුව 32, 33 හා 41 වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පාපන්දු ක්‍රීඩාව සඳහා වන ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ පරිපාලන හා අනෙකුත් අවැසි කටයුතු සහ අදාළ නිලවරණයන් කැඳවීමට හා පැවැත්වීමට 2023 ජූලි මස 24 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුව මෙයින් පත් කරමි.

(1) ඒ. ජී. සී. දේශප්‍රිය මයා - සභාපති
(2) එන්. කේ. කපුරුබණ්ඩාර මිය - ලේකම්
(3) කේ. ඒ. ආර්. සී. කහඳවල මයා - භාණ්ඩාගාරික

තවද, 1973 අංක 25 දරන ක්‍රීඩා පනත හා එහි සංශෝධන අනුව 32, 33 හා 41 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව සහ 1974 අංක 2 දරන ජාතික ක්‍රීඩා සංගම් රෙගුලාසි සහ එහි සංශෝධන යටතේ ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය සම්බන්ධයෙන් පහත නියෝගයන් ක්‍රියාත්මක කළ යුතුය.

01. නිලවරණයෙන් පත්වන නිලධාරී මණ්ඩලයේ නිල කාලය වසර හතරක් විය යුතුය.
02. මහලේකම්/ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීම.
03. 2022 සැප්තැම්බර් මස 22 දින සම්මත කරන ලද ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ ව්‍යවස්ථාවට අනුව නව විධායක කමිටුව නිලවරණයකින් තෝරා පත් කරනු ලැබේ.

**රොෂාන් රණසිංහ** (පා. ම.),
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2023 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

EOG - 07-0230